කීපය තුළ සංචාරක කර්මාන්තයේ දළ ඉපැයීම්වල වාර්තාගත වූ වර්ධන වේගය නොකඩවා ලබා ගැනීමට 1982 දී අපොහොසත් වූ බව පෙනේ. තීරුබදු රහිත සාප්පු සංකීර්ණය ඇතුලු සංචාරක සාප්පුවලින් 1982 දී මුලු දළ ඉපයීම්වලින් සියයට 22 ක් ලැබුණි. මෙය පසුගිය වර්ෂයේ සංචාරක සාප්පුවලින් ලැබුණු, දළ ඉපැයීම්වලින් සියයට 7 ක ප්‍රමාණය හා සැසඳේ. මෙම වැඩිවීමට මූලික වශයෙන් හේතු වූයේ තීරු බදු රහිත සාප්පු සංකීර්ණය මුළු සංචාරක සාප්පු-වලින් ලැබූ දළ ඉපැයීම්වලින් සියයට 76 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 496 ක දයකත්වයක් ලැබීමය. 1981 වසර තුළදී, හෝටල් හා චාරිකා නියෝජිතයන්ගේ දළ ලැබීම්වල දයකත්වයවූ පිළිවෙලින් සියයට 22 ක හා සියයට 33 ක ප්‍රමාණයන් හා සළකා බලන විට මෙම වර්ෂයේ ඒවා පිළිවෙලින් සියයට 17 ක් සහ සියයට 21 ක් ලෙස පහත බැස ඇත.

සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම්වල ඇති වැදගත්කම ගෙවුම් තුලන දත්තයන්ගෙන් මැනිය හැකිය. 1979 වසරේ සේවා ගිණුමේ ආදයමින් සියයට 35 ක් වූ සංචාරක කර්මාන්තයේ දයකත්වය 1982 දී සියයට 34 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු විදේශ විනිමය ඉපැයීම් 1981 වර්ෂයේ දී රටේ මුළු විනිමය ඉපැයීමේ වැදගත්කම අනුව ලැබූ පස්වන ස්ථානයේ සිට 1982 දී රබර් අපනයන ආදයම් ඉක්මවා යමින් වැදගත්කම අනුව සිව්වන ස්ථානයට වර්ධනය වී ඇත.

සංචාරක ව්‍යාපාරය මගින් ඍජු ලෙස එම කර්මාන්තය තුළ ද, වක්‍ර ලෙස අනිකුත් සේවා අංශයෙහි ද පුළුල් වශයෙන් රැකියා අවස්ථාවන් ලබාදේ. 1982 දී සංචාරක කර්මාන්තයෙහි ඍජුව නියැලුනු සංඛ්‍යාව 25,000 ක් වූ අතර, එය 1981 වර්ෂයට වඩා සියයට 8 ක වර්ධනයක් පෙන්වා ඇත. 1982 අවසානය වන විට සංචාරක කටයුතුවලින් වක්‍රව උත්පාදනය කළ මුළු රැකියා ගණන 35,000 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1982 අවසානය වන විට සංචාරක කර්මාන්තයෙහි නියුතු මුළු සංඛ්‍යාව 60,000 ක් විය. මෙය මෙම අංශය තුළ සෑම සංචාරකයන් 7 දෙනකුගේ පැමිණීම එක රැකියාව බැගින් ඇති කිරීමට ඉවහල් වී ඇති බව හඟවයි.

ශ්‍රේණිගත නවාතැන් අංශයේ ඒකක ගණන 1981 දී 115 සිට 1982 දී 123 දක්වා වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළු කාමර ගණන 6,891 සිට 7,539 දක්වා ඉහළ නැඟුණි. මේ අතර, ශ්‍රේණිගත නවාතැන් අංශයේ වාර්ෂික කාමර උපයෝගිතා අනුපාතය 1980 දී වාර්තාගත ඉහළම ප්‍රමාණය වූ සියයට 57 සිට ක්‍රමයෙන් 1982 දී සියයට 47.8 දක්වා පහත වැටුණි. වාර්ෂිකව, රට තුළට පැමිණෙන සංචාරකයන්ගේ ගණන වැඩි වූවත්, ශ්‍රේණිගත නවාතැන් අංශයේ වාර්ෂික උපයෝගිතා අනුපාතය පහත වැටීමෙන් පෙනී යන්නේ සංචාරකයන් නවාතැන් පහසුකම් සඳහා ශ්‍රේණිගත අංශයෙන් බැහැර ස්ථාන කරා ඇදී යාම වැඩිවී ඇති බවය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, බටහිර යුරෝපීය වෙළෙඳපොල මත අධික ලෙස රඳා පැවැත්ම, එම කර්මාන්තයෙහි ඇති මූලික ව්‍යුහාත්මක දුර්වලතාවයකි. එබැවින් මෙම කලාපයෙන් පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාවෙහි ඇති විය හැකි වෙනස්කම්වලින් සංචා-රක කර්මාන්තයට එල්ල විය හැකි අහිතකර විපාක වැලැක්වීම සඳහා මෙරටට පැමිණෙන සංචාරකයන්ගේ මූලයන් විවිධාංගීකරණයක් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුව ඇත. තවත් වැදගත් කරුණක් වන්නේ සංචාරකයන් ශ්‍රේණිගත නවාතැන් වෙනුවට අඩු වියදම් නවාතැන්වල නවාතැන් ගැනීම වැඩිවීමය. මෙය මෙම අංශයේ වූ මිල ඉහළයාම් නිසා සිදුවූවා විය හැකිය. දනට හෝටල් මත පනවා ඇති බදු සහ ඉහළ ගොස් ඇති විදුලි සහ ජල ගාස්තු මෙම මිල ඉහලයාමට සම්බන්ධ විය හැකිය.

## ගෙවුම් තුලනය

රුපියල් දශලක්ෂ 11,793 (විගැහි දශලක්ෂ 515) ක් වූ ශ්‍රී ලංකාවේ 1982 ගෙවුම් තුලන-යෙහි ජංගම ගිණුම් හිඟය වාර්තා ගතවී ඇති වැඩිම හිඟයයි. සැසඳීමක් වශයෙන් ගතහොත් 1981 දී එම හිඟය රුපියල් දශලක්ෂ 8,342 (විගැහි දශලක්ෂ 375) ක් විය. ජංගම ගිණුම් හිඟය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්, 1981 සියයට 11 සිට 1982 සියයට 13 දක්වා වැඩි විය. ජංගම ගිණුම් හිඟය සියයට 26 කින් හා දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් වශයෙන් එහි කොටස ප්‍රතිශත ඒකක 4 කින් අඩු වූ, 1981 විකාශනය හා සසඳන විට, මෙම වෙනස්වීම් එතරම් සතුටුදයක නැත. විශේෂයෙන්ම, විදේශීය ණය ගැනීම් වෙනුවෙන් වූ පොළී ගෙවීම්

# ගෙවුම් තුලනය
වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

වැඩිවීමෙන්, ශුද්ධ සේවා ලැබීම් සැළකිය යුතු අන්දමින් අඩුවීම සහ අපනයනයන්හි මන්දගාමී වර්ධනයට ප්‍රතිමුඛව ආනයනයන්හි වර්ධනය වේගවත් වීම, විවරණයට අදල වර්ෂයෙහි ජංගම ගිණුමේ ශේෂය පිරිහීමට හේතු විය. 1981 ප්‍රමාණයට වඩා සියයට 26 ක (විගැහි අනුව) වැඩිවීමක් පිළිබිඹු කරමින්, 1982 මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම රුපියල් දශලක්ෂ 9,885 (විගැහි දශලක්ෂ 431) ක් විය. මේ නිසා, වාර්තාගත වූ ජංගම ගිණුම් හිඟයක් තිබුනේ වී නමුදු, සමස්ත ශේෂය 1981 මට්ටමට වඩා පහත තත්ත්වයක පවත්වා ගැනීමට හැකි විය. (1982 විගැහි දශලක්ෂ 24 ට ප්‍රතිමුඛව එය ඊට පෙර වර්ෂයේ විගැහි දශලක්ෂ 26 කි.) වර්ෂය තුළදී රටෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිතය, සමස්ත හිඟයේ මට්ටමට පහත වැටුණි. එහෙත්, වර්ෂය අවසානයේදී, දළ විදේශ වත්කම්, සියයට 20 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 10,956 (විගැහි දශලක්ෂ 466) ක් විය. 1982 අවසානයේ දළ විදේශ වත්කම්, 1983 සිදු කිරීමට බලාපොරොත්තුවූ ආනයනයන්ගෙන් මාස 3 ක වියදම් පියවීමට ප්‍රමාණවත් විය.

වෙළෙඳ භාණ්ඩ අපනයනයෙන් ලද ඉපැයීම් 1981 රුපියල් දශලක්ෂ 20,507 (විගැහි දශලක්ෂ 903) සිට 1982 රුපියල් දශලක්ෂ 21,434 (විගැහි දශලක්ෂ 934) දක්වා වැඩි විය. මෙය විගැහි අනුව සියයට 3.4 ක වැඩිවීමකි. තේ, රබර් සහ පොල් යන සම්ප්‍රදයික අපනයන මගින් වර්ෂය තුලදී ලද ඉපැයීම්, (විගැහි අනුව) සියයට 6.9 ක අඩුවීමක් පෙන්නුම් කළේය. එහෙයින්, 1982 අපනයන ඉපැයීම් වැඩිවීම, මුළුමනින්ම, රෙදිපිළි, මසා නිම කරන ලද ඇඳුම්, වෙනත් කාර්මික බඩු සහ සුළු කෘෂි නිෂ්පාදන මගින් වූ වැඩි ඉපැයීම්වල ප්‍රතිඵලයකි.

ආනයන වියදම, 1981 රුපියල් දශලක්ෂ 36,123 (විගැහි දශලක්ෂ 1,596) සිට 1982 රුපියල් දශලක්ෂ 41,902 (විගැහි දශලක්ෂ 1,826) දක්වා විගැහි අනුව සියයට 14 කින් වැඩි විය. මෙම වැඩිවීමේ අනුපාතිකය, 1977–1980 කාලච්ඡේදය තුළදී වාර්තා වූ සියයට 36 ක සාමාන්‍ය වැඩිවීමට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු වුවද, 1981 සියයට 1 ක වැඩිවීමට වඩා සැලෙහන අන්දමින් වැඩිය. වැඩි වූ ආනයන වියදමින් විශාල ප්‍රමාණයක් ආයෝජන භාණ්ඩ වර්ග සඳහා වූ අතර, මෙම පන්තියේ ආනයන සඳහා වූ වියදම 1981 හා 1982 අතර සියයට 46 කින් වැඩි විය. මෙම විශාල වැඩිවීමට තරමක් දුරට හේතු වූයේ, වර්ෂය තුළදී නැව් සහ ගුවන්යානා ආනයනය කිරීමයි. මෙම කාලච්ඡේදය තුළ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 7 කින් පහත වැටුණු අතර, අන්තර් භාණ්ඩ සඳහා වූ වියදම සියයට 12 කින් ඉහළ ගියේය.

1981 රුපියල් දශලක්ෂ 238 (විගැහි දශලක්ෂ 10) ක් වූ ගෙවුම් තුලනයෙහි සේවා ගිණුම් අතිරික්තය හා සසඳන කළ, එය 1982 දී රුපියල් දශලක්ෂ 126 (විගැහි දශලක්ෂ 5) ක සුළු අතිරික්තයක් වාර්තා කළේය. මෙය 1973 සිට කාලයක් තුළ ක්‍රමයෙන් වැඩිවෙමින් පැවති සේවා ගිණුම් අතිරික්තය කෙරෙහි 1980 සිට බලපෑ අහිතකර උපනතිය තවදුරටත් තීව්‍ර වීමකි.

විදේශ ණය වෙනුවෙන් වැඩි වූ පොළී ගෙවීම්, මෙම විකාශනයට මුල් හේතුව විය. විගැහි අනුව සියයට 17 ක වැඩිවීමක් වාර්තා කරමින්, විදේශීය ණය, ජා.මූ.අ. හැර ගැනීම් සහ වෙළෙඳ ණය වෙනුවෙන් වූ පොළී ගෙවීම, 1981 රුපියල් දශලක්ෂ 2,128 (විගැහි දශලක්ෂ 93) සිට 1982 රුපියල් දශලක්ෂ 2,497 (විගැහි දශලක්ෂ 109) දක්වා වැඩි විය. විදේශ ණය සේවාව සඳහා රටෙහි විදේශ විනිමය ඉපැයීම්වලින් වැඩි කොටසක් වෙන් කළයුතු හෙයින්, විශේෂයෙන්ම මන්දගාමී අපනයන වර්ධනයක් තුළ, විදේශ ණය වෙනුවෙන් වූ වැඩිවෙමින් පවතින පොළී ගෙවීම් සැළකිල්ලට ගත යුතු කරුණකි. 1981 දී සියයට 10.3 ක් වූ අපනයන ඉපැයුම් හා පොළී ගෙවීම් අතර අනුපාතය 1982 දී සියයට 11.7 දක්වා ඉහළ නැගුණි. 1981 රුපියල් දශලක්ෂ 552 (විගැහි දශලක්ෂ 24) සිට 1982 දී රුපියල් දශලක්ෂ 742 (විගැහි දශලක්ෂ 32) දක්වා ඉහළ යමින්, පිටරටවල ඇති ආයෝජන වෙනුවෙන් වූ පොළී ඉපැයීම්, වර්ෂය තුළදී වැඩි වුවද, පොළී ගෙවීම් වැඩි වේගයකින් මෙන්ම විශාල ප්‍රමාණයකින් ද වැඩි වූ කරුණෙන් හැඟෙන්නේ, පොළී ගණුදෙනු සම්බන්ධයෙන් වූ හිඟය, 1981 රුපියල් දශලක්ෂ 1,576 (විගැහි දශලක්ෂ 69) සිට 1982 රුපියල් දශලක්ෂ 1,755 (විගැහි දශලක්ෂ 77) දක්වා නගිමින් පුලුල් වූ බවයි. මෙය, ලාභ හා ලාභාංශ ගෙවීම් වෙනුවෙන් වැඩි වූ වියදම ද සමඟ 'ආයෝජන ආදයම' වර්ගයෙහි හිඟය වර්ෂය තුළදී සියයට 15 කින්, රුපියල් දශලක්ෂ 1,968 (විගැහි දශලක්ෂ 86) දක්වා වැඩි කරවීය. මෑත අතීතයේ දී, විදේශ ආධාර හා ආයෝජන ගලා ඒම වැඩි වූ හෙයින්, මෙම හිඟය අනාගතයේදී ද තවතවත් වැඩි විය හැකි ය.

# 1 · 39 සංඛ්‍යා සටහන

## ගෙවුම් තුලනය - විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම 1978 - 1982

| ශීර්ෂය | රුපියල් දශලක්ෂ | | | | | විගැහි දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 (අ) | 1981 (අ) | 1982(ආ) | 1978 | 1979 | 1980(අ) | 1981(අ) | 1982(ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ .. .. | – 2,393 | – 7,288 | – 16,312 | – 15,616 | – 20,468 | – 144 | – 362 | – 758 | – 693 | – 892 |
| අපනයන (නැ. වි. ස.) .. | 13,207 | 15,282 | 17,603 | 20,507 | 21,434 | 675 | 759 | 818 | 903 | 934 |
| ආනයන (මි. ර. ගැ.) .. | – 15,600 | – 22,570 | – 33,915 | – 36,123 | – 41,902 | – 819 | – 1,121 | – 1,576 | – 1,596 | – 1,826 |
| 2. සේවා .. .. | + 119 | + 739 | + 859 | + 238 | + 126 | + 6 | + 37 | + 40 | + 10 | + 5 |
| ලැබීම් .. .. | 1,942 | 2,992 | 4,605 | 5,937 | 7,648 | 99 | 149 | 214 | 261 | 333 |
| ගෙවීම් .. .. | – 1,823 | – 2,253 | – 3,746 | – 5,699 | – 7,522 | – 93 | – 112 | – 174 | – 251 | – 328 |
| 3. භාණ්ඩ හා සේවා (1 + 2) .. | – 2,274 | – 6,549 | – 15,453 | – 15,378 | – 20,342 | – 138 | – 325 | – 718 | – 683 | – 887 |
| 4. සංක්‍රාම (ශුද්ධ) .. .. | + 1,242 | + 2,993 | + 4,541 | + 7,036 | + 8,549 | + 63 | + 148 | + 211 | + 308 | + 372 |
| පෞද්ගලික (ශුද්ධ) .. .. | 342 | 754 | 2,260 | 3,918 | 5,170 | 17 | 37 | 105 | 172 | 225 |
| නිල (ශුද්ධ) .. .. | 900 | 2,239 | 2,281 | 3,118 | 3,379 | 46 | 111 | 106 | 136 | 147 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) .. | – 1,032 | – 3,556 | – 10,912 | – 8,342 | – 11,793 | – 75 | – 177 | – 507 | – 375 | – 515 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය .. | + 2,600 | + 3,306 | + 6,585 | + 7,691 | + 9,885 | + 133 | + 164 | + 306 | + 341 | + 431 |
| පෞද්ගලික අංශය .. .. | 145 | 874 | 3,981 | 2,571 | 5,009 | 8 | 43 | 185 | 116 | 218 |
| රාජ්‍ය අංශය .. .. | 2,455 | 2,432 | 2,604 | 5,120 | 4,876 | 125 | 121 | 121 | 225 | 213 |
| දිගු කාලීන (ශුද්ධ) .. | 2,609 | 2,432 | 2,604 | 5,120 | 4,876 | 133 | 121 | 121 | 225 | 213 |
| ලැබීම් .. .. | (3,680) | (3,351) | (4,326) | (6,087) | (6,393) | (188) | (167) | (201) | (267) | (280) |
| ආපසු ගෙවීම් .. | (– 1,071) | (– 919) | (– 1,722) | (– 967) | (– 1,517) | (– 55) | (– 46) | (– 80) | (– 42) | (– 67) |
| කෙටිකාලීන (ශුද්ධ) .. | – 154 | — | — | — | — | – 8 | — | — | — | — |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | + 344 | – 18 | + 607 | – 39 | – 124 | — | — | — | — | — |
| 8. වැරදීම් හා අත්හැරීම් .. | – 50 | + 820 | + 495 | + 32 | + 883 | + 7 | + 36 | + 23 | – 4 | + 60 |
| 9. විගැහි වෙන් කිරීම් .. .. | — | 241 | 258 | 252 | — | — | 12 | 12 | 12 | — |
| 10. සමස්ථ ශේෂය .. .. | + 1,862 | + 793 | – 2,967 | – 406 | – 1,149 | + 65 | + 35 | – 166 | – 26 | – 24 |
| 11. මූල්‍ය වෙනස්වීම් .. .. | – 1,862 | – 793 | + 2,967 | + 406 | + 1,149 | – 65 | – 35 | + 166 | + 26 | + 24 |
| සාමාන්‍ය විනිමය අනුපාතිකය ශ්‍රී. ල. රු./විගැහි .. .. | | | | | | 19.58 | 20.13 | 21.52 | 22.67 | 22.98 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: මූල්‍ය අංශය කාලච්ඡේදය අවසානයේ අනුපාතිකයන් අනුව පරිවර්තනය කොට ඇත.

සංචාරක, වරාය, ප්‍රවාහනය හා රක්ෂණ, සේවා ගිණුමෙහි ප්‍රධාන ඉපැයීම් මාර්ග විය. වරාය, ප්‍රවාහනය හා රක්ෂණයෙන් ලද ශුද්ධ ඉපැයීම්, 1981 රුපියල් දශලක්ෂ 227 (විගැහි දශලක්ෂ 9) සිට 1982 රුපියල් දශලක්ෂ 264 (විගැහි දශලක්ෂ 12) දක්වා සියයට 16.3 කින් වැඩි විය. සංචාරයෙන් ලත් ඉපැයීම 1981 රුපියල් දශලක්ෂ 2,244 (විගැහි දශලක්ෂ 99) සිට 1982 රුපියල් දශලක්ෂ 2,573 (විගැහි දශලක්ෂ 112) දක්වා වැඩි වූයේ, බොහෝ සෙයින්ම සංචාරකයින්ගේ පැමිණීම, වර්ෂය තුළදී සියයට 10 කින් වැඩි වූ හෙයිනි. මේ අතර, සංචාරයෙන් ලද ශුද්ධ ලැබීම් රුපියල් දශලක්ෂ 1,679 (විගැහි දශලක්ෂ 73) දක්වා හීන කරමින් ශ්‍රී ලාංකිකයින්ගේ විදේශ ගමන් වෙනුවෙන් වූ ගෙවීම් සියයට 27.2 ක් වැනි විශාල ප්‍රමාණයකින් වැඩි විය.

## 1·40 සංඛ්‍යා සටහන
## සේවා සහ සංක්‍රාම 1981 – 1982

රුපියල් දශලක්ෂ (විගැහි දශලක්ෂ වරහන් තුළ)

| ශීර්ෂය | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1981 | (අ) 1982 | වෙනස 1981/82 | 1981 | (අ) 1982 | වෙනස 1981/82 | 1981 | 1982 |
| වරාය, ප්‍රවාහනය සහ රක්ෂණ .. | 964 (42) | 1,212 (53) | + 248 (+11) | 737 (33) | 948 (41) | + 211 (+8) | + 227 (+9) | + 264) (+12) |
| සංචාර .. | 2,244 (99) | 2,573 (112) | + 329 (+13) | 703 (31) | 894 (39) | + 191 (+8) | +1,541 (+68) | +1,679 (+73) |
| ආයෝජන ආදායම් .. | 552 (24) | 744 (32) | + 192 (+8) | 2,264 (99) | 2,712 (118) | + 448 (+19) | –1,712 (–75) | –1,968 (–86) |
| 1· ලාභ සහ ලාභාංශ .. | — (—) | 2 (—) | + 2 (–) | 136 (6) | 215 (9) | + 79 (+3) | – 136 (–6) | – 213 (–9) |
| 2· පොළී .. | 552 (24) | 742 (32) | + 190 (+8) | 2,128 (93) | 2,497 (109) | + 369 (+16) | –1,576 (–69) | –1,755 (–77) |
| රජයේ වියදම් .. | 201 (9) | 234 (10) | + 33 (+1) | 151 (7) | 171 (8) | + 20 (+1) | + 50 (+2) | + 63 (+2) |
| විවිධ .. | 1,976 (87) | 2,885 (126) | + 909 (+39) | 1,844 (81) | 2,797 (122) | + 953 (+41) | + 132 (+6) | + 88 (+4) |
| මුළු සේවා .. | 5,937 (261) | 7,648 (333) | +1,711 (+72) | 5,699 (251) | 7,522 (328) | +1,823 (+77) | + 238 (+10) | + 126 (+5) |
| පෞද්ගලික සංක්‍රාම .. | 4,430 (195) | 5,789 (252) | +1,359 (+57) | 512 (23) | 619 (27) | + 107 (+4) | +3,918 (+172) | +5,170 (+225) |
| නිල සංක්‍රාම .. | 3,118 (136) | 3,379 (147) | + 261 (+11) | — (—) | — (–) | — (—) | +3,118 (+136) | +3,379 (+147) |
| මුළු සංක්‍රාම .. | 7,548 (331) | 9,168 (399) | +1,620 (+68) | 512 (23) | 619 (27) | + 107 (+4) | +7,036 (+308) | +8,549 (+372) |
| මුළු සේවා සහ සංක්‍රාම .. | 13,485 (592) | 16,816 (732) | +3,331 (+140) | 6,211 (274) | 8,141 (355) | +1,930 (+81) | +7,274 (+318) | +8,675 (+377) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

මෑත වර්ෂවල දුටු උපනතිය අනුව යමින්, බොහෝ සෙයින්, විදේශ රැකියාවන්හි නියුතු ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රේෂණවලින් සමන්විත, පෞද්ගලික සංක්‍රාම ලැබීම් වර්ෂය තුළදී සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. මෙකී ලැබීම් සියයට 29.2 කින් වැඩි වී, 1981 රුපියල් දශලක්ෂ 4,430 (විගැහි දශලක්ෂ 195) මට්ටමේ සිට 1982 දී රුපියල් දශලක්ෂ 5,789 (විගැහි දශලක්ෂ 252) ක් විය. මෙය, ශ්‍රී ලංකා ගෙවුම් තුලනයෙහි මෑත වර්ෂවලදී විශාල යහපත් බලපෑමක් කළ එකම අයිතමය විය. 1977 සිට අඛණ්ඩව වැඩි වුණු මෙම ගිණුමෙහි ශුද්ධ අතිරික්තය, වෙළෙඳ භාණ්ඩ ගිණුමේ අයහපත් හැඩගැසීම සමනය කිරීම සම්බන්ධයෙන් සැළකිය යුතු කාර්යයක් ඉටුකර ඇත.

විදේශ රාජ්‍යවලින් සහ ජාත්‍යන්තර සංවිධාන වලින් ව්‍යාපෘති හා ද්‍රව්‍යාධාර වශයෙන් ලද ප්‍රදානයන්ගෙන් සමන්විත නිල සංක්‍රාම, 1981 රුපියල් දශලක්ෂ 3,118 (විගැහි දශලක්ෂ 136) සිට 1982 දී රුපියල් දශලක්ෂ 3,379 (විගැහි දශලක්ෂ 147) දක්වා සියයට 8 කින් වැඩි විය.

වර්ෂය තුළදී ප්‍රධාන දයකයින් වූයේ, ඕස්ට්‍රේලියාව, පින්ලන්තය, ජපානය, නෙදර්ලන්තය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ නෝර්විජියානු නියෝජ්‍යත්වය (නොරාඩ්), ස්විඩන් ජාත්‍යන්තර සංවර්ධන අධිකාරිය (සිඩා), එක්සත් රාජධානිය, එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යත්ව සහ ඇමෙරිකා එක්සත් ජනපදයත් ය. පෞද්ගලික හා නිළ සංක්‍රාම යන දෙඅංශයම වෙනුවෙන් ලද ගලා ඒම්වල වැඩිවීමක් පිළිබිඹු කරමින්, සංක්‍රාම ගිණුමෙහි සමස්ත අතිරික්තය 1981 රුපියල් දශලක්ෂ 7,036 (විගැහි දශලක්ෂ 308) සිට රුපියල් දශලක්ෂ 8,549 (විගැහි දශලක්ෂ 372) දක්වා වැඩි විය.

සේවා ගිණුමේ සුළු අතිරික්තයත්, සංක්‍රාම ලැබීම් සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීමත්, වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිහය සමහන් කිරීමට සෑහෙන අන්දමින් උපකාරී විය. මේ අනුව, රුපියල් දශලක්ෂ 20,468 (විගැහි දශලක්ෂ 892) ක් වූ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිහය හා සසඳන විට වර්ෂයේ ජංගම ගිණුමේ හිහය රුපියල් දශලක්ෂ 11,793 (විගැහි දශලක්ෂ 515) ක් විය. 1981 ජංගම ගිණුම් හිහය රුපියල් දශලක්ෂ 8,342 (විගැහි දශලක්ෂ 375) ක් විය. මෙම හිහය විශාල වශයෙන් මූල්‍යකරණය කරන ලද්දේ දිගුකාලීන ආධාර ණය, වෙළෙඳ ණය ගැනීම් සහ සෘජු ආයෝජන යනාදියෙන් සමන්විත මූල්‍ය නොවන ප්‍රාග්ධන මගිනි.

**1 · 41 සංඛ්‍යා සටහන**

**විදේශ සම්පත් පරතරය පියවීම 1980—1982**

| වර්ගය | රුපියල් දශලක්ෂ | | | විගැහි දශලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1980(අ) | 1981(අ) | 1982(ආ) | 1980 (අ) | 1981(අ) | 1982(ආ) |
| **1. විදේශීය ඉපැයීම්** .. | **24,726** | **30,874** | **34,871** | **1,149** | **1,359** | **1,519** |
| 1.1 ආනයන .. | 17,603 | 20,507 | 21,434 | 818 | 903 | 934 |
| 1.2 සේවා .. | 4,605 | 5,937 | 7,648 | 214 | 261 | 333 |
| 1.3 පෞද්ගලික සංක්‍රාම .. | 2,518 | 4,430 | 5,789 | 117 | 195 | 252 |
| **2. විදේශීය ගෙවීම්** .. | **43,112** | **56,101** | **64,069** | **2,013** | **2,478** | **2,794** |
| 2.1 ආනයන .. | 33,915 | 36,123 | 41,902 | 1,576 | 1,596 | 1,826 |
| 2.2 සේවා .. | 3,746 | 5,699 | 7,522 | 174 | 251 | 328 |
| 2.3 පෞද්ගලික සංක්‍රාම .. | 258 | 512 | 619 | 12 | 23 | 27 |
| 2.4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් .. | 5,193 | 13,767 | 14,026 | 251 | 608 | 613 |
| **3. විදේශ සම්පත් පරතරය** .. | **– 18,386** | **– 25,227** | **– 29,198** | **– 864** | **– 1,119** | **– 1,275** |
| **4. සම්පත් පරතරය පියවීම** .. | **+ 18,386** | **+ 25,227** | **+ 29,198** | **+ 864** | **+ 1,119** | **+ 1,275** |
| 4.1 ණය තත්ත්වය කෙරෙහි බල-නොපාන ගනුදෙනු තුලින් පියවීම .. | 3,292 | 4,373 | 4,459 | 153 | 192 | 194 |
| 4.1.1 නිළ ප්‍රදන .. | 2,281 | 3,118 | 3,379 | 106 | 136 | 147 |
| 4.1.2 සෘජු ආයෝජන .. | 753 | 1,003 | 1,080 | 35 | 44 | 47 |
| 4.1.3 විගැහි වෙන් කිරීම් .. | 258 | 252 | — | 12 | 12 | — |
| 4.2 ණය ලබා ගැනීම් සහ සංචිත උපයෝගී කර ගැනීම .. | **13,992** | **20,861** | **23,980** | **688** | **931** | **1,021** |
| 4.2.1 දිගු කාලීන ණය .. | 4,143 | 5,350 | 5,663 | 193 | 234 | 248 |
| 4.2.2 කෙටි කාලීන ණය .. | 4,454 | 10,518 | 9,940 | 207 | 466 | 434 |
| 4.2.3 සැපයුම්කරුවන්ගේ ණය .. | 441 | 1,233 | 1,160 | 21 | 55 | 51 |
| 4.2.4 වෙළෙඳ ණය ගැනීම් (පෞද්ගලික අංශය) .. | 732 | 1,546 | 4,916 | 34 | 68 | 214 |
| 4.2.5 බැංකු ණය ගැනීම් .. | 361 | — | 1,595 | 16 | — | 68 |
| 4.2.6 ද්විපාර්ශික ශේෂ .. | — | — | — | — | — | — |
| 4.2.7 ජා. මූ. අ. හැර ගැනීම් .. | 828 | 4,528 | 1,369 | 30 | 194 | 39 |
| 4.2.8 වෙනත් .. | 147 | 142 | 1,071 | 8 | 5 | 46 |
| 4.2.9 සංචිත .. | 2,886 | – 2,456 | – 1,734 | 179 | – 91 | – 79 |
| **5. රුපියල් අගය පිලිබඳ ගැලපිලි** .. | **+ 607** | **– 39** | **– 124** | — | — | — |
| **6. වැරදීම් හා අත්හැරීම්** .. | **+ 495** | **+ 32** | **+ 883** | **+ 23** | **– 4** | **+ 60** |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මූල්‍ය නොවන අංශයේ ප්‍රාග්ධන සංචලනය නොහොත් පෞද්ගලික හා නිළ මාර්ගවලින් මූල්‍යකරණය සඳහා තිබුණ මුළු ප්‍රමාණය, 1981 රුපියල් දශලක්ෂ 7,691 (විගැහි දශලක්ෂ 341) හා සසඳන විට 1982 දී රුපියල් දශලක්ෂ 9,885 (විගැහි දශලක්ෂ 431 ) ක් විය. මෙය 1981 මූල්‍යකරණය සඳහා තිබුණු ප්‍රමාණයට වඩා සියයට 26 කින් (විගැහි අනුව) වැඩිය. ඒසා විශාල ප්‍රමාණයක ප්‍රාග්ධන ගලාඒම් තිබුණු හෙයින්, ජංගම ගණුදෙනු මගින් ඇතිවුණු අහිතකර බලපෑම් සමනය කිරීමට සහ 1982 සමස්ත හිඟය රුපියල් දශලක්ෂ 1,149 (විගැහි දශලක්ෂ 24) ක පවත්වා ගැනීමට හැකි විය.

1982 දී, ගෙවුම් තුලන හිඟය මූල්‍යකරණය කිරීම සඳහා, කෙටිකාලීන ණය උපයෝගී කොටගත් ප්‍රමාණය 1981 ට වඩා අඩු විය. 1981 රුපියල් දශලක්ෂ 386 (විගැහි දශලක්ෂ 20) ශුද්ධ වැඩිවීමක සිට 1982 රුපියල් දශලක්ෂ 64 (විගැහි දශලක්ෂ 2.5) ශුද්ධ අඩුවීමක් පෙන් වූ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා ගන්නා ලද කෙටිකාලීන ණය අඩුවීම, මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ශුද්ධ පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධන ගලා ඒම් 1981 රුපියල් දශලක්ෂ 2,184 (විගැහි දශලක්ෂ 96) සිට 1982 රුපියල් දශලක්ෂ 5,072 (විගැහි දශලක්ෂ 220) දක්වා සැහෙන ප්‍රමාණයකින් වැඩි විය. ඉහත කී ප්‍රමාණයෙන් මහ කොළඹ ආර්ථික කොමිසම සහ විදේශීය ආයෝජන උපදේශක කමිටුව යටතේ ඇති ව්‍යවසායයන්වල ශුද්ධ ආයෝජනය රුපියල් දශලක්ෂ 1,030 (විගැහි දශලක්ෂ 45) ක් විය. මෙයින් මහ කොළඹ ආර්ථික කොමිසමේ ආයෝජන කොටස සාපේක්ෂ වශයෙන් අඩු ප්‍රමාණ-යක් වූ අතර, එය සියයට 43 ක් පමණක් විය. පෞද්ගලික අංශයේ සැපයුම්කරුවන්ගේ ණය සහ වෙළෙඳ ණය ගැනීම්වලින් සමන්විත, සෙසු පෞද්ගලික අංශයේ ශුද්ධ දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම්, 1981 රුපියල් දශලක්ෂ 1,238 (විගැහි දශලක්ෂ 54) හා සසඳන විට 1982 දී රුපියල් දශලක්ෂ 4,042 (විගැහි දශලක්ෂ 175) ක් විය.

වර්ෂය තුළදී ලද නිළ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 6,393 (විගැහි දශලක්ෂ 280) ක් විය. මෙය 1981 ප්‍රමාණයට වඩා සියයට 5 ක වැඩිවීමකි. මුළු ප්‍රමාණය 1981 රුපියල් දශලක්ෂ 1,931 (විගැහි දශලක්ෂ 84) සිට 1982 රුපියල් දශලක්ෂ 3,225 (විගැහි දශලක්ෂ 141) දක්වා වැඩි වූ අතර, මෙය විශාල වශයෙන්ම, ව්‍යාපෘති ණය ලබාගැනීම් වැඩිවීමේ ප්‍රතිඵලයකි. එහෙත්, එම කාලච්ඡේදයේ දී ද්‍රව්‍යාධාර ණය සියයට 21.5 කින් පහත වැටුණි. යුරෝ ව්‍යවහාර මුදල් ණයකින් සහ යෙන් වලින් නිකුත් කරන ලද ඇපකරවලින් සමන්විත, රජයේ වෙළෙඳ ණය භාවිතය විවරණයට භාජනය වන වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 1,090 (විගැහි දශ ලක්ෂ 48) ක් විය. රජය විසින් ලබා ගන්නා ලද වෙළෙඳ ණය 1980 සිට අයවැය මෙන්ම ගෙවුම් තුලන හිඟය පියවීම සඳහා යොදා ගැනුණි. ණය ආපසු ගෙවීම් සහ ව්‍යාප්ත කර ඇති සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වූ අත්තිකාරම් ගෙවීම් 1982 දී රුපියල් දශ ලක්ෂ 1,517 (විගැහි දශලක්ෂ 67) ක් විය. මේ හැර, පෙර වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 5,120 (විගැහි දශ ලක්ෂ 225) ක නිළ ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් හා සසඳන විට, 1982 දී මූල්‍යකරණය සඳහා රුපියල් දශලක්ෂ 4,876 (විගැහි දශලක්ෂ 213) ක රාජ්‍ය අංශයේ ශුද්ධ ප්‍රාග්ධනයක් විය.

1982 ගෙවුම් තුලන හිඟය මූල්‍යකරණය කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පත් වශයෙන්, සහනදායී මූල්‍ය පහසුකම් ක්‍රමය යටතේ ලැබුණු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 916 (විගැහි දශ ලක්ෂ 39) ක් විය. විගැහි දශ ලක්ෂ 11 ක ශුද්ධ ආපසු ගලායාමක් ඇති කරමින්, පසුගිය හැරගැනීම් වෙනුවෙන් කරන ලද ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 1,146 (විගැහි දශලක්ෂ 50) ක ප්‍රමාණයක් විය.

**විනිමය අනුපාතික වෙනස්වීම්**

ලෝකයේ ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව 1982 දී ශ්‍රී ලංකා රුපියල වෙනස් වූ ආකාරය පිළිබඳ විශ්ලේෂණයේ දී, 1982 තුළ රුපියලේ අගය ඇ.එ.ජ. ඩොලරයට ප්‍රතිමුඛව සියයට 3.6 කින් අඩුවී, 1977 නොවැම්බර් 16 වැනි දින සිට සියයට 25.0 ක සමුච්චිත අගය අඩුවීමක් පෙන්නුම් කළේය. එසේ වුවද, 1982 දී, ස්ටර්ලිං පවුමට ප්‍රතිමුඛව සියයට 12.9 කින් ද,

# විනිමය අනුපාතික

1977 නොවැම්බර් 16 වැනි දින සිට සමුච්චිත ප්‍රතිශත වෙනස්වීම්




ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: 1977 වර්ෂය සඳහා අනුපාතික වෙනස්වීම් පෙන්වා ඇත්තේ නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහාය. සෙසු වර්ෂවල මෙම වෙනස්වීම් දක්වා ඇත්තේ කාර්තුගත පදනමක් මතය.

ජපන් යෙන් වලට ප්‍රතිමුඛව සියයට 2.3 කින් ද, ඩොයිෂ් මාර්කයට ප්‍රතිමුඛව සියයට 1.0 කින් ද, ප්‍රංශ ප්‍රැන්කුවට ප්‍රතිමුඛව සියයට 12.8 කින් ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 2.2 කින් ද, ශ්‍රී ලංකා රුපියලේ අගය වැඩි විය මේ අනුව. 1977 නොවැම්බර් 16 වැනි දින සිට ස්ටර්ලිං පවුම, ජපන් යෙන්, ඩොයිෂ් මාර්කය සහ ඉන්දියානු රුපියල ට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලේ සමුච්චිත අගය අඩුවීම, පිළිවෙලින් සියයට 16.1, සියයට 28.5, සියයට 20.9 හා සියයට 14.3 ක් වූ අතර, ප්‍රංශ ප්‍රැන්කුවට ප්‍රතිමුඛව අගය වැඩිවීම සියයට 3.6 ක් විය. 1977 නොවැම්බර් 16 වැනි දින සිට සමස්ත අගය අඩුවීම සියයට 19.8 ක් දක්වා අඩු කරමින්, වර්ෂය තුළදී විගැහි වලට ප්‍රතිමුඛව රුපියලේ අගය සියයට 1.3 කින් අඩු විය.

**1 · 42 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම් (අ) 1980 – 1982**

| මුදල් වර්ගය | වර්ෂය අවසානයේ විනිමය අනුපාතික (ඒකකයට රුපියල්) | | | පෙර වර්ෂයට වඩා % වෙනස් විම(ආ) | |
|---|---|---|---|---|---|
| | 1980 | 1981 | 1982 | 1981 | 1982 |
| විශේෂ හැර ගැනීම් .. | 22·8977 | 23·8738 | 23.5569 | 4·08 | (1·34) |
| එ. ජ. ඩොලර් .. | 18·0000 | 20·5500 | 21·3200 | 12·42 | 3.61 |
| එ. රා. ස්ටර්ලින් පවුම් .. | 42·6955 | 39·0965 | 34·6130 | (9·21) | (12·94) |
| ඩොයිෂ් මාර්ක් .. | 9·2125 | 9·0655 | 8·9806 | (1·61) | (0·95) |
| ජපන් යෙන් .. | 0·08755 | 0·09330 | 0.09123 | 6·16 | (2·27) |
| ප්‍රංශ ප්‍රැන්ක් .. | 3·9750 | 3·5800 | 3·1726 | (11·03) | (12·84) |
| ඉන්දියානු රුපියල් | 2·2875 | 2·2063 | 2.1597 | (3·68) | (2·16) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) වරහන් තුළ ඇති සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියලෙහි අගය වැඩිවීම පෙන්නුම් කරයි.
(ආ) ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය මුදල් සමකය අනුව වෙනස්වීම් ගණන් බලා ඇත.

**විදේශ වත්කම්**

ගෙවුම් තුලනයෙහි සමස්ත හිඟයක් පැවතුන ද වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 1,734 (විගැහි දශ ලක්ෂ 79) කින් වැඩි විය. මේ අතර, ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශලක්ෂ 1,149 (විගැහි දශලක්ෂ 24) ක අඩුවීමක් පෙන්නුම් කළේය. පසු කරුණ, බොහෝ සෙයින් වෙළෙඳ බැංකු සහ මහ බැංකුව වැඩියෙන් රැස්කර ගත් වගකීම්වල ප්‍රතිඵලයකි. කෙටිකාලීන ස්වභාවයක වූ මහ බැංකුවේ විදේශ ණය ගැනීම්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කල්පිරෙන ප්‍රතිග්‍රහණ ණය පියවීම පිණිස වූ අතර, වෙළෙඳ බැංකුවල වගකීම් විශේෂයෙන්ම වැඩිවූයේ අනේවාසික ව්‍යවහාර මුදල් ගිණුම්වල තැන්පතු වැඩි වූ හෙයිනි.

1982 අවසානයේ දී, මහ බැංකුව වෙළෙඳ බැංකු සහ රජය, රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන යනාදියෙහි දළ විදේශ වත්කම්, පිළිවෙලින් රුපියල් දශලක්ෂ 7,096 (විගැහි දශලක්ෂ 302), රුපියල් දශලක්ෂ 3,585 (විගැහි දශලක්ෂ 152) සහ රුපියල් දශලක්ෂ 275 (විගැහි දශලක්ෂ 12) ක්ව පැවතුනි. රුපියල් දශලක්ෂ 10,956 (විගැහි දශලක්ෂ 466) ක් වූ 1982 අවසානයේ දළ විදේශ වත්කම්, 1983 සිදු කරන්නට බලාපොරොත්තු වූ මාස 3 ක පමණ ආනයන පියවීමට ප්‍රමාණවත් විය.

**විදේශ ණය හා සේවා ගෙවීම්**

දිගුකාලීන ණය, රාජ්‍ය අංශයේ සැපයුම්කරුවන්ගේ ණය (රාජ්‍ය සංස්ථාවල ණය ඇතුලුව) ජා.මූ.අ. හැර ගැනීම් සහ විදේශ ණය ගැනීම යනාදියෙන් සමන්විත ශ්‍රී ලංකාවේ නොපියවූ සමස්ත විදේශ ණය, 1982 අගදී රුපියල් දශ ලක්ෂ 42,534 (විගැහි දශ ලක්ෂ 1,810) ක් ව පැවතුනි. මෙය 1981 ප්‍රමාණයට වඩා සියයට 22.1 ක වැඩිවීමකි. දිගුකාලීන ණයෙන් සියයට 92.5 ක් වූ ව්‍යාපෘති නොවූ ණය ලබාගැනීම සියයට 12.1 කින් ද, ව්‍යාපෘති ණය ලබාගැනීම සියයට 34.8 කින් ද, වැඩි වූ හෙයින්, නොපියවූ ණය, වර්ෂය තුළදී සියයට 18.6 කින් වැඩි විය. ජාත්‍යන්තර මූල්‍ය ආයතනයට නොපියවූ ණයගැති බව වර්ෂය තුළදී සියයට 19.0 කින් වැඩි වූ අතර, නොපියවූ සැපයුම්කරුවන්ගේ ණය සියයට 10.2 කින් අඩු විය. 1981 අවසානයේ දී රුපියල් දශලක්ෂ 267 (විගැහි දශ ලක්ෂ 11) ක්ව තිබුණු නොපියවූ බැංකු ණය ගැනීම්, 1982 අවසානයේදී රුපියල් දශලක්ෂ 1,851 (විගැහි දශලක්ෂ 79) දක්වා නැග තිබුණි.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව







ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY

## 1 . 43 සංඛ්‍යා සටහන

## නොපියවූ විදේශ ණය (අ) සහ ණය සේවා ගෙවීම් 1978 – 1982

රුපියල් දශලක්ෂ (විගැහි දශලක්ෂ වරහන් තුළ)

| වර්ගය | 1978 | 1979 | 1980 | 1981 (ආ) | 1982(ඇ) |
|---|---|---|---|---|---|
| 1. දිගුකාලීන ණය මෙවායින් | 14,582·3<br>(720·7) | 15,840·6<br>(778·0) | 22,276·8<br>(1,035·2) | 29,172·2<br>(1,224·2) | 34,597·4<br>(1,471·1) |
| 1·1 ව්‍යාපෘති ණය .. | 4,833·1<br>(238·9) | 5,569·5<br>(273·5) | 6,784·3<br>(315·3) | 9,232·8<br>(387·4) | 12,451·8<br>(529·5) |
| 1·2 ව්‍යාපෘති නොවන ණය .. | 8,969·9<br>(443·3) | 8,900·9<br>(437·2) | 13,305·5<br>(618·3) | 17,433·3<br>(731·6) | 19,545·7<br>(831·1) |
| 1·3 ජා.මූ.අ. භාරකාර අරමුදල් ණය .. | 779·3<br>(38·5) | 1,370·2<br>(67·3) | 2,187·0<br>(101·6) | 2,506·1<br>(105·2) | 2,599·9<br>(110·5) |
| 2. සැපයුම්කරුවන්ගේ ණය | 991·4<br>(49·0) | 828·6<br>(40·7) | 787·6<br>(36·6) | 1,110·4<br>(46·6) | 996·6<br>(42·4) |
| 3. ජා. මූ. අ. හැර ගැනීම | 1,548·0<br>(76·5) | 2,501·3<br>(126·3) | 2,335·1<br>(112·6) | 4,274·6<br>(194·3) | 5,088·7<br>(217·8) |
| 4. බැංකු ණය ගැනීම | 155·1<br>(7·7) | 69·1<br>(3·4) | 428·6<br>(18·7) | 266·9<br>(11·2) | 1,851·2<br>(78·7) |
| 5. නොපියවූ මුළු ණය .. | 17,276·8<br>(853·9) | 19,239·6<br>(948·4) | 25,828·1<br>(1,203·1) | 34,824·1<br>(1,476·3) | 42,533·9<br>(1,810·0) |
| 6. ණය සේවා ගෙවීම් .. | 2,347·2<br>(119·8) | 2,383·1<br>(118·0) | 2,762·8<br>(137·0) | 3,528·8<br>(156·7) | 4,424·4<br>(193·1) |
| 6·1 ණය ආපසු ගෙවීම් .. | 1,862·4<br>(95·1) | 1,627·4<br>(80·8) | 1,781·5<br>(91·4) | 2,121·3<br>(95·5) | 2,571·3<br>(112·3) |
| (i) ජා.මූ.අරමුදලට .. | 440·4<br>(22·5) | 622·6<br>(30·9) | 748·5<br>(43·4) | 1,289·2<br>(59·1) | 1,146·3<br>(49·9) |
| (ii) වෙනත් අයට .. | 1,422·0<br>(72·6) | 1,004·8<br>(49·9) | 1,033·0<br>(48·0) | 832·1<br>(36·4) | 1,425·0<br>(62·4) |
| 6·2 පොලී ගෙවීම් | 484·8<br>(24·7) | 755·7<br>(37·2) | 981·3<br>(45·6) | 1,407·5<br>(61·2) | 1,853·1<br>(80·8) |
| (i) ජා.මූ.අරමුදලට .. | 154·4<br>(7·9) | 170·0<br>(8·4) | 345·6<br>(12·4) | 446·6<br>(19·7) | 518·6<br>(22·5) |
| (ii) වෙනත් අයට .. | 330·4<br>(16·8) | 585·7<br>(28·8) | 635·7<br>(33·2) | 960·9<br>(41·5) | 1,334·5<br>(58·3) |
| 7. වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවා ඉපැයීම් .. | 15,148·8<br>(773·7) | 18,274·7<br>(907·7) | 22,208·0<br>(1,032·0) | 26,443·8<br>(1,164·4) | 29,082·9<br>(1,267·0) |
| 8. ණය සේවා අනුපාතය .. (ඇ) (6, 7 හි ප්‍රතිශතයක් වශයෙන්) | 15·5 | 13·0 | 12·4 | 13·3 | 15·2 |
| 9. ණය සේවා අනුපාතය .. (ඇ) (ජා. මූ. අ. ගනුදෙනු හැර) .. | 11·6 | 8·7 | 7·5 | 6·8 | 9·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) කෙටි කාලීන වෙළෙඳ ණය හැර
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඇ) රුපියල් අගය අනුව ගණන් බලා ඇත. විනිමය අනුපාතික වර්ෂය තුළදී වෙනස් වන බැවින් විගැහි අනුව ගණන් බැලුවහොත් ණය සේවා අනුපාතය, මෙම අනුපාතවලට වඩා වෙනස් විය හැක.

රුපියල් අනුව සියයට 25.4 කින් වැඩි වූ දිගුකාලීන ණය, සැපයුම්කරුවන්ගේ ණය, ජා.මූ.අ හැර ගැනීම් සහ විදේශීය බැංකු හා වෙනත් ආයතනයන්ගෙන් ලබාගත් ණය වෙනුවෙන් වූ ආපසු ගෙවීම් හා පොළී ගෙවීම්වලින් සමන්විත, ණය සේවා ගෙවීම්, 1981 රුපියල් දශලක්ෂ 3,529 (විගැහි දශලක්ෂ 157) සිට 1982 දී රුපියල් දශලක්ෂ 4,424 (විගැහි දශලක්ෂ 193) දක්වා වැඩි විය. 1981 වූ සියයට 14.4 ක වැඩිවීම හා සසඳන කල අනුරූප වැඩිවීම විගැහි අනුව සියයට 22.9 ක් විය. 1981 හා සසඳන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කළ ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් 1982 දී සියයට 4.1 කින් අඩු වූ අතර, එම කාලච්ඡේදය තුළ වෙනත් ණය වෙනුවෙන් වූ ණය සේවා ගෙවීම් සියයට 53.9 කින් වැඩි විය. මෙම විකාශනවල ශුද්ධ ප්‍රතිඵලය වූයේ, ණය සේවා අනුපාතය 1981 සියයට 13.3 සිට 1982 සියයට 15.2 දක්වා වැඩිවීමයි. ජා.මූ.අ. ගණුදෙනු නොමැතිව ණය සේවා අනුපාතය, එම කාලසීමාව තුළ සියයට 6.8 සිට සියයට 9.5 දක්වා වැඩි විය.

## රාජ්‍ය මූල්‍ය කටයුතු

රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් දිස් වූයේ 1981 වර්ෂයේදී අයවැය කටයුතු සම්බන්ධයෙන් ඇති කර ගත් වඩාත් යහපත් තත්ත්වයේ සිට මඳ පසුබෑමකි. 1980 දී තරමක් තියුණු වූ අයවැය අසමතුලිතතාවය, 1981 වර්ෂයේ දී ආංශික වශයෙන් නිවැරදි කිරීමට යෙදුනි. එහෙත් 1981 වර්ෂයේ අයවැයෙන් පැන නැගුණු වඩාත් යහපත් අනුකූලතාවයන්ට ගැලපෙන සේ 1982 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයන් හැඩ ගැසුනේ නැත.

### සමස්ත රාජ්‍ය මූල්‍ය තත්ත්වය

1982 වර්ෂයේ මුළු රජයේ වියදම රුපියල් දශ ලක්ෂ 38,097 ක් වූ අතර, එය 1981 වර්ෂයට වඩා සියයට 23 ක වැඩි වීමකි. පවත්නා මිල ගණන් යටතේ රජයේ වියදම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 36.6 ක සිට සියයට 38.0 ක් දක්වා වැඩි විය. සමාලෝචනයට භාජනය වන වසරේ පුනරාවර්තන වියදම රුපියල් දශ ලක්ෂ 19,230 ක් වූ අතර, එය ඉකුත් වසරට වඩා සියයට 8.5 ක වැඩි වීමකි. රුපියල් දශ ලක්ෂ 17,809 ක් වූ මුළු ආදායම සියයට 10 ක වැඩිවීමක් දක්විය. ඒ අනුව, අයවැයෙහි වර්තන ගිණුමේ රුපියල් දශ ලක්ෂ 1,421 ක හිඟයක් විය. මෙවැනි තත්ත්වයක් උද වූයේ අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් වඩාත් හිතකර වර්ධනයක් ඇතිවී තිබියදීත් ය. පිළිවෙලින් වසර 13 ක් තිස්සේ පැවති ශුද්ධ ගෙවීම්වලින් පසුව අත්තිකාරම් ගිණුම් යටතේ රුපියල් දශ ලක්ෂ 883 ක ශුද්ධ ලැබීමක් සටහන් විය. වර්තන ගිණුමේ හිඟය, අයහපත් ආකාරයේ අත්තිකාරම් ගිණුම් කටයුතු අත්හල විට වර්තන ගිණුමේ අතිරික්තයක් තිබූ පසුගිය වසර කිහිපයේ අත්දැකීම්වලට ප්‍රතිවිරුද්ධ ස්වරූපයක් ගන්නා ලදී. 1982 වර්ෂයේ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 18,867 ක් වූ අතර, එය 1981 වර්ෂයට වඩා සියයට 41 ක වැඩි වීමක් පෙන්විය. 1982 වර්ෂයේ සමස්ත අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 20,289 ක් වූ අතර එය ද.දේ.නි. යෙන් සියයට 20 කට පමණ ප්‍රමාණයකට සමාන විය. 1981 දී එය සියයට 17 ක් විය.

අයවැය හිඟය දේශීය සහ විදේශීය මූලයන්ගෙන් ලබා ගත් සම්පත් මගින් පියවා ගන්නා ලදී. හිඟයෙන් සියයට 54 ක ප්‍රමාණයක් දේශීය මූලයන්ගෙන් පියවා ගත් අතර ශේෂය විදේශීය සම්පත් මගින් පියවන ලදී. ඉලක්ක කරනු ලැබූ රුපියල් දශ ලක්ෂ 14,198 ක් වෙනුවට ලැබූ මුළු විදේශීය මූල්‍යකරණ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,270 ක් විය. ව්‍යාපෘති ණය, භාණ්ඩ ණය සහ මුදල් ණය ඇතුළු වෙනත් ණය යටතේ පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 3,256, රුපියල් දශ ලක්ෂ 1,355 සහ රුපියල් දශ ලක්ෂ 1,090 ක් ලැබුණු අතර දීමනා වශයෙන් ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,569 ක් විය.

දේශීය සම්පත් අතුරෙන් බැංකු නොවන වෙළෙඳ පොළ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,894 ක් වූ අතර, මුලින් ඇස්තමේන්තු කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 4,000 ක් විය. වෙළෙඳ පොළ නොවන ණය ගැනීම් මගින් රුපියල් දශ ලක්ෂ 1,354 ක් ලැබුණි. සමස්ත අයවැය හිඟය පියවීම සඳහා මෙසේ ලබා ගත් සියළුම සම්පත් ප්‍රමාණවත් නොවූ අතර, රුපියල් දශ ලක්ෂ 4,006 ක මුදලක් බැංකු අංශයෙන් ලබා ගැනීමට සිදු විය. රුපියල් දශ ලක්ෂ 16 ක රුපියල් ණය ආපසු ගෙවීම් සහ රුපියල් දශ ලක්ෂ 235 ක මුදල් ශේෂ ගොඩ නැගීම් සහිතව වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 3,755 ක් විය.